# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2054/36 - 2018 ජනවාරි මස 17 වැනි බදාදා - 2018.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DS-WD/LND/5/2/2
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/2003/VEP/509

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මලිත්තගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මුලික පිඹුරු අංක ගා 3793හි සවිස්තරව පෙන්නුම් කරන කැබලි අංක 01 දරන ඉඩම් කැබැල්ල.

01. කැබලි අංක 01
ඉඩමේ නම: අකුරටිය වත්ත; විස්තරය: ගෙවතු, ස්ථිර ගොඩනැගිලි ඇත; ප්‍රමාණය: හෙක්. 1.3120.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 පෙබරවාරි මස 05 වැනි දින පෙ.ව. 10.00ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 ජනවාරි මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා පරීක්ෂණ දිනයේදී හිමිකම් ඔප්පු ඉදිරිපත් කළ යුතුය.

ප්‍රාදේශීය ලේකම් ,
වැලිවිටිය දිවිතුර,
ගාල්ල දිස්ත්‍රික්කය.

2018 ජනවාරි මස 08 වැනි දින.
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

02 - 125

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DS-WD/LND/5/2/4(i).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/2004/VEP/173.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශතාවයේ විස්තර* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දිවිතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක ගා 3758හි සවිස්තරව පෙන්නුම් කරන කැබලි අංක 01 හා 02 දරන ඉඩම් කැබලි.

**01. කැබලි අංක 01**
ඉඩමේ නම: අකුරටියවත්ත හෙවත් හම්මැලිවල උඩුමුල්ල; විස්තරය: විවෘත මුඩු බිම; ප්‍රමාණය: හෙක්. 0.0553.

**02. කැබලි අංක 02**
ඉඩමේ නම: අකුරටියවත්ත හෙවත් හම්මැලිවල උඩුමුල්ල; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 2ක් හා වැසිකිළියක් සහ ළිඳක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.0618.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 පෙබරවාරි මස 05 වැනි දින පෙ.ව. 10.00ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 ජනවාරි මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා පරීක්ෂණ දිනයේදී හිමිකම් ඔප්පු ඉදිරිපත් කල යුතුය.

ප්‍රාදේශීය ලේකම් ,
වැලිවිටිය දිවිතුර.

2018 ජනවාරි මස 08 වැනි දින.
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

02 - 126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.